# විෂයමාලා ආවරණය සඳහා යෝජිත වැඩසටහන

## දෙවන ශ්‍රේණිය (පළමුවන වාරය)

## 2022


**මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**මහරගම**

## යෝජිත වැඩසටහන සඳහා උපදෙස් මාලාව

2022 පාසල් වර්ෂය සඳහා පාසල්වල දෛනික පරිපාලන කටයුතු හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය බාධාවකින් තොරව සාමාන්‍ය පරිදි පවත්වා ගැනීම උදෙසා කඩිනම් පියවර ගැනීමට සිදු වී තිබේ.

ඒ අනුව මෙම අධ්‍යයන වර්ෂය තුළ දී අනිවාර්යයෙන් ම අත්පත් කරගත යුතු අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගත හඳුනා ගෙන ඊට අනුව කාලය වෙන් කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම මෙමගින් අපේක්ෂිත ය.

ඒ අනුව ප්‍රාථමික අධ්‍යාපන අවධියේ එක් එක් ශ්‍රේණිවල පළමුවන වාරයට නිර්දිෂ්ට ඉගෙනුම් අන්තර්ගතවලින් අත්‍යවශ්‍ය ඉගෙනුම් කොටස් පමණක් මෙමගින් ඉදිරිපත් කරනු ලබයි. මෙම විෂය කොටස් සාධනය වූ විට දෙවන වාරයට අවශ්‍ය ඉගෙනුම් අවස්ථා සඳහා සුදුසුකම් ලබන බව වැඩිදුරටත් සඳහන් කරමු.

එමෙන් ම දැනටමත් පළමුවන වාරයට අදාළ යම් පමණක විෂය කොටස් ප්‍රමාණයක් ප්‍රමාණාත්මක ව හා ගුණාත්මක ව විවිධතාවලින් යුතු ව පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වී ඇත. එසේ වුවද අප විසින් යෝජනා කරනු ලබන්නේ පළමුවන වාරයට අදාළ ව සිසුන් විසින් අත්‍යවශ්‍යයෙන් ම අත්පත් කරගත යුතු විෂය කොටස් ය. මෙම යෝජිත විෂය කොටස්වලින් ද ඔබ පාසලේ ආවරණය වූ විවිධ විෂයය කොටස් තිබිය හැකි ය. එසේ වූ විට දී එම කොටස් අතහැර ඊළඟට ඇති විෂයය කොටසේ සිට පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කිරීමට අප විසින් යෝජනා කරන්නෙමු.

එමෙන් ම එක් එක් විෂය අන්තර්ගත සඳහා යෝජිත කාලය ඔබ පන්ති කාමරයේ සිටින සිසුන්ගේ සාධනය මත නම්‍යශීලී ව හා සාධාරණ ව වෙනස් කර ගැනීමට ඔබට නිදහස ඇත. එනමුත් යෝජිත විෂය අන්තර්ගතවලින් අඩු නොකොට ඒ සියල්ල මනා ලෙස සම්පූර්ණ කිරීමේ වගකීම ද ඔබ සතු ය.

එක් එක් විෂය සඳහා ගුරුමාර්ගෝපදේශයට අනුව පළමුවන වාරයට නිර්දිෂ්ට විෂය අන්තර්ගත මාර්ගගත ක්‍රමයට හෝ ඉතාමත් සරල පැහැදිලි කිරීම්වලින් අනතුරු ව නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රියාකාරකම් ලෙසට හෝ ආවරණය කළ හැකි ය. එසේ වුවත් නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ ලබා දෙන ක්‍රියාකාරකම් සිසුන්ට අනවශ්‍ය බරක්, පීඩනයක් නොවන ආකාරයට ලබා දීම ද ඔබ සතු වගකීමකි.

එමෙන් ම අප විසින් යෝජනා කරනු ලබන අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගත ඒ ඒ විෂය තක්සේරුවට අනුව විධිමත් ලෙස තක්සේරු කිරීම ඔබ සතු වගකීමකි. මීට අමතර ව මාර්ගගත ක්‍රමයට සහ නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමයට ආවරණය කරනු ලබන විෂය කොටස්වලට අදාළ ව සිසුන් විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් නැවත පන්ති කාමරයට ගෙන්වා ගත යුතු ය. අනතුරු ව ඒවා සිසුන් ඉදිරියේ පරීක්ෂා කර අවශ්‍ය ප්‍රතිපෝෂණ සහ ඉදිරිපෝෂණ ලබා දී විෂය තක්සේරුවට අනුව තක්සේරු කිරීම ද සිදු කළ යුතු ය.

ඒ අනුව සෑම විෂයයක ම අදාළ වාරයට අපේක්ෂිත ඉගෙනුම් පල කරා සියලු ම සිසුන් ළඟා කරවීම ඔබ සතු වගකීමකි. කෙසේ වුවත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සිසුන් සෞඛ්‍ය සම්පන්න ව, ආරක්ෂිත ව, ප්‍රීතිමත් ව සහ ක්‍රියාශීලී ව ඒ සඳහා යොමු කරලීමේ වගකීම ද ඔබ සතු ය. ඒ අනුව ශ්‍රී ලාංකේය ප්‍රාථමික අධ්‍යාපනය හදාරන සිසුන්ගේ ඉගෙනුම් කාර්යය ශක්තිමත් හා ඵලදායී කරලීමේ උතුම් අරමුණින් මේ සියල්ල ක්‍රියාත්මක කිරීමට ඔබට ශක්තිය ලැබේවා යි පතමු.

**මව්බස (සිංහල)**
**දෙවන ශ්‍රේණිය (පළමුවන වාරය)**

දෙවන ශ්‍රේණියේ පළමුවන වාරය සඳහා ආවරණය කළ යුතු අත්‍යවශ්‍ය ම විෂය අන්තර්ගත පහත පරිදි යෝජනා කෙරෙයි. ඒ අනුව දී ඇති අනුක්‍රමයට අදාළ ව ඉගෙනුම් පල සාධනයට අවශ්‍ය ක්‍රියාකාරකම් සිදු කළ යුතු ය.

දෙවන ශ්‍රේණියේ පළමුවන වාරයට යෝජිත මෙහි සඳහන් විෂය අන්තර්ගතවලට අදාළ ක්‍රියාකාරකම් කිරීමට පෙර පළමුවන ශ්‍රේණියේ දී මව්බස විෂය සඳහා අත්පත් කරගත යුතු අත්‍යවශ්‍ය විෂය කොටස් සිසුන් තුළ සාධනය වී ඇද්දැයි පරීක්ෂා කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා පැය කිහිපයක් වෙන් කර සිසුන්ගේ හැකියාව මැන බැලීමට සහ සිසුන්ගේ පෙර මතකය ආවර්ජනය කිරීමට ඔබ විසින් සකස් කරන ලද ක්‍රියාකාරකම් සිසුන්ට ලබා දිය යුතු ය. ඒ අනුව එක් එක් සිසුන්ගේ සාධන මට්ටම පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඔබ විසින් ලබා ගත යුතු ය. ඉන් පසු ව දෙවන ශ්‍රේණිය සඳහා අප විසින් යෝජනා කරනු ලබන විෂය අන්තර්ගත සඳහා යොමු විය හැකි ය.

ඒ අනුව පළමුවන ශ්‍රේණියේ දී උගත් අකුරු 36 භාවිත කර පිලි රහිත වචන තනි රූලේ ලිවීම සහ කියවීමට අදාළ පළමුවන ශ්‍රේණියේ දෙවන නිපුණතාවට ඇතුළත් ක්‍රියාකාරකම්වලින් පුනරීක්ෂණ අභ්‍යාස ලෙසට ක්‍රියාත්මක කළ යුතු ය. එමගින් එම අකුරු සිසුන්ට මතකයට නැංවීමටත්, එම හැකියාව මැන බැලීමෙන් අවශ්‍ය ඉදිරි ප්‍රතිපෝෂණ අවශ්‍යතා සැලසුම් කිරීමටත් හැකි වනු ඇත. එයින් සිසුන්ගේ අකුරු කියවීමේ හා ලිවීමේ හැකියාව පිළිබඳ ගුරුවරයාට මනා තක්සේරුවක් කර ගනිමින් දෙවන ශ්‍රේණියේ අකුරු හඳුන්වා දීමට යොමු විය හැකි ය.

එමෙන් ම R 1 W 1 නිපුණතාවයට අදාළ එක් එක් හඳුන්වා දීම්වලින් අනතුරු ව ඊට අදාළ අභ්‍යාස පන්ති කාමරය තුළ සිදු කිරීමෙන් සෑහීමකට පත් නොවී එම සංකල්ප තව දුරටත් තහවුරු කිරීම සඳහා නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ අභ්‍යාස ලබා දිය හැකි ය. එමෙන් ම පළමුවන ශ්‍රේණියේ වැඩ පොතෙහි ඇති උචිත අභ්‍යාසවල ද සිසුන් නිරත කරවිය හැකි ය.

## දෙවන ශ්‍රේණිය - මව්බස (සිංහල)

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | $L_1$<br>අවබෝධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා සවන් දෙයි.<br><br>$S_1$<br>අවබෝධයෙන් පැහැදිලි උච්චාරණය සහිත ව අර්ථය පැහැදිලි වන සේ කතා කරයි. | ■ පවසන දෙයට අවබෝධයෙන් යුතු ව සවන් දී ක්‍රියා කරයි. | ■ පවසන දෙයට සවන් දීම.<br>■ පින්තූර බලා පවසන දෙයට සවන් දීම.<br>■ නිදහසේ කතා කිරීම.<br>■ පින්තූර බලා කතා කිරීම. | ක්‍රියාකාරකම 1 | 12 | මි.30 |
| | | | | ක්‍රියාකාරකම 2 | 12 | මි.30 |
| | | | | ක්‍රියාකාරකම 5 | 14 | මි.30 |
| | | | | ක්‍රියාකාරකම 6 | 14 | මි.30 |

## දෙවන ශ්‍රේණිය - මව්බස (සිංහල)

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| | $L_2$<br>සවන්දීමේ කුසලතා සංවර්ධනය සඳහා සවන් දෙයි.<br><br>$S_2$<br>කථන කුසලතා සංවර්ධනය සඳහා කතා කරයි.<br><br>$R_2$<br>කියවීමේ කුසලතා සංවර්ධනය සඳහා කියවයි.<br><br>$W_2$<br>ලිවීමේ කුසලතා සංවර්ධනය සඳහා ලියයි. | ▪ වචනවල ශබ්ද විභේදනය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br><br>▪ අකුරු ගළපා අර්ථවත් වචන සාදයි. | ▪ අකුරු දෙකේ වචන<br>▪ අකුරු තුනේ වචන | පළමු වන ශ්‍රේණියේ දී උගත් අකුරු 36 භාවිත කර පිලි රහිත වචන තනිරුලේ ලිවීම හා කියවීම.<br><br>පිලි රහිත අකුරු දෙකේ වචන කියවීම හා ලිවීම.<br><br>ක්‍රියාකාරකම 01 | 1 ශ්‍රේණිය ගු.මා<br><br>54, 55 | මි.30 |
| | | | | පිලි රහිත අකුරු තුනේ වචන කියවීම හා ලිවීම.<br><br>ක්‍රියාකාරකම 02 | 55, 56 | මි.30 |

දෙවන ශ්‍රේණිය - මව්බස (සිංහල)

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| | $R_1$<br>කියවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් කියවයි.<br><br>$W_1$<br>සම්මත නිවැරදි ක්‍රමයට ලියයි. | ▪ අකුරු එකතු කර වචන සාදා වැකි ලියයි. | ▪ පිලි රහිත අකුරු කියවීම හා ලිවීම. | **අකුරු හඳුන්වා දීම.**<br><br>මධ්‍ය අක්ෂර 9 තනිරූලේ ලිවීම හා කියවීම.<br>(ෆ, ශ, ෂ, හ, ස, සෘ, සෲ, අං, අඃ) | 2 ශ්‍රේණිය<br><br>17, 19 | පැය 03 |
| | | | | ආරෝහණ අක්ෂර 13 තනි රූලේ ලිවීම හා කියවීම.<br>(ථ, ඵ, ධ, ඨ, ඪ, ඛ, ජ, ඖ, ඓ, ඣ, ඞ, ඡ, ළු) | 18, 19 | පැය 06 |
| | | | | අවරෝහණ අක්ෂර දෙක (ඥ, ඤ) තනි රූලේ ලිවීම හා කියවීම. | 18, 19 | පැය 01 |
| ▪ සරල වචන අසා නිවැරදි ව පැහැදිලි අකුරින් ලියයි. | | | ▪ හල් කිරීමේ ලකුණ යෙදුණු වචන/වාක්‍ය කියවීම හා ලිවීම. | **හල් කිරීමේ ලකුණ හඳුන්වා දීම.**<br>ක්‍රියාකාරකම 01<br><br>හල් කිරීමේ ලකුණ 'කොඩිය' යෙදෙන වචන කියවීම හා ලිවීම.<br><br>හල් කිරීමේ ලකුණ 'රැහැන' යෙදෙන වචන කියවීම හා ලිවීම.<br><br>හල් කිරීමේ ලකුණ යෙදුණු වාක්‍ය ලිවීම හා කියවීම. | 20<br><br><br><br><br><br>21 | පැය 01 |

දෙවන ශ්‍රේණිය - මව්බස (සිංහල)

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| | | | ▪ පළමු වන හා දෙවන ශ්‍රේණිවල උගත් අකුරු භාවිත කිරීම.<br>▪ පිලි සහිත අකුරු කියවීම හා ලිවීම.<br>▪ පිලි සහිත අකුරු එකතු කර වචන කියවීම හා ලිවීම.<br>▪ පිලි සහිත සරල වාක්‍ය ලිවීම.<br>▪ නැවතීමේ ලකුණට අනුගත ව ලිවීම. | **පිලි සහිත වචන හඳුන්වා දීම.**<br>ඇලපිල්ල - ක්‍රියාකාරකම 01 හා 02<br>වචන කියවීම හා ලිවීම.<br>වාක්‍ය කියවීම හා ලිවීම.<br><br>කෙටි ඇදපිල්ල - ක්‍රියාකාරකම 01 හා 02<br>වචන කියවීම හා ලිවීම.<br>වාක්‍ය කියවීම හා ලිවීම. | <br>22<br>23<br><br><br><br>23<br>24 | පැය 02 |
| | | | | දික් ඇදපිල්ල - ක්‍රියාකාරකම 01 හා 02<br>වචන කියවීම හා ලිවීම.<br>වාක්‍ය කියවීම හා ලිවීම. | 24<br>25 | පැය 01 |
| | | | | කෙටි ඉස්පිල්ල - ක්‍රියාකාරකම 01 හා 02<br>වචන කියවීම හා ලිවීම.<br>වාක්‍ය කියවීම හා ලිවීම. | 25 | පැය 01 |
| | | | | දික් ඉස්පිල්ල - ක්‍රියාකාරකම 01<br>වචන කියවීම හා ලිවීම.<br>වාක්‍ය කියවීම හා ලිවීම. | 26 | පැය 01 |
| | | | | කෙටි පාපිල්ල - ක්‍රියාකාරකම 01 හා 02<br>වචන කියවීම හා ලිවීම.<br>වාක්‍ය කියවීම හා ලිවීම. | 27<br>28 | පැය 01 |

දෙවන ශ්‍රේණිය - මව්බස (සිංහල)

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| | | | | දික් පාපිල්ල - ක්‍රියාකාරකම 01 හා 02<br>වචන කියවීම හා ලිවීම.<br>වාක්‍ය කියවීම හා ලිවීම. | 28<br>29 | පැය 01 |
| | | | | කොම්බුව - ක්‍රියාකාරකම 01 හා 02<br>වචන කියවීම හා ලිවීම.<br>වාක්‍ය කියවීම හා ලිවීම. | 29<br>30 | පැය 01 |
| | | | | කොම්බුව සහිත හල් කිරීමේ ලකුණ - ක්‍රියාකාරකම 01 හා 02<br>වචන කියවීම හා ලිවීම.<br>වාක්‍ය කියවීම හා ලිවීම. | 30<br>31 | පැය 01 |
| | | | | කොම්බුව සහිත ඇලපිල්ල - ක්‍රියාකාරකම 01<br>වචන කියවීම හා ලිවීම.<br>වාක්‍ය කියවීම හා ලිවීම. | 31<br>32 | පැය 01 |
| | | | | කොම්බුව, ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ - ක්‍රියාකාරකම 01 හා 02<br>වචන කියවීම හා ලිවීම.<br>වාක්‍ය කියවීම හා ලිවීම. | 32<br>33 | පැය 01 |
| | | | | ගැටපිල්ල - ක්‍රියාකාරකම 01<br>වචන කියවීම හා ලිවීම. | 33<br>34 | පැය 01 |
| | | | | ගැට ඇලපිලි දෙක - ක්‍රියාකාරකම 01<br>වචන කියවීම හා ලිවීම. | 34<br>35 | පැය 01 |

## දෙවන ශ්‍රේණිය - මව්බස (සිංහල)

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| | | | | කොම්බු දෙක - ක්‍රියාකාරකම 01<br>වචන කියවීම හා ලිවීම. | 35<br>36 | පැය<br>01 |
| | | | | කොම්බුව හා ගයනුකිත්ත - ක්‍රියාකාරකම 01<br>වචන කියවීම හා ලිවීම. | 36<br>37 | පැය<br>01 |
| | | | යංශය<br>යංශය යෙදුණු වචන | යංශය හඳුන්වා දීම - ක්‍රියාකාරකම 01 හා 02<br>යංශය යෙදුණු වචන කියවීම හා ලිවීම. | 37,38, 39 | පැය<br>01 |
| | | | රකාරාංශය<br>රකාරාංශය යෙදුණු වචන | රකාරාංශය හඳුන්වා දීම - ක්‍රියාකාරකම 01 හා 02<br>රකාරාංශය යෙදුණු වචන කියවීම හා ලිවීම. | 39<br>40<br>41 | පැය<br>01 |
| ■ ඉදිරිපත් කරනු ලබන ඡේදයක් නිවැරදි ව නිසි උච්චාරණය සහිත ව කියවයි.<br><br>■ සරල වැකියක් අකුරු පැහැදිලි ව නිවැරදි ව පිටපත් කරයි.<br><br>■ සරල වැකියක් කියවා අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දෙයි. | | | නැවතීමේ ලකුණට අනුගත ව කියවීම හා ලිවීම<br><br>ප්‍රශ්නාර්ථ ලකුණට අනුගත ව කියවීම හා ලිවීම.<br><br>කොමාව නිවැරදි ව භාවිත කරමින් කියවීම හා ලිවීම | සිංහල කියවීම් පොත - 2 ශ්‍රේණිය<br><br>පාඩම 01 - වැව් ඉවුරේ සංගීත පන්තිය<br>පාඩම 03 - හැමෝම දිනුම්<br>පාඩම 09 - අපූරු තෑග්ග<br>ශබ්ද නගා කියවීම.<br><br>නිර්දිෂ්ට විරාම ලකුණුවලට අනුගත ව කියවීම.<br><br>නැවතීමේ ලකුණ යෙදුණු වාක්‍ය උපුටා ලිවීම හා කියවීම. (පාඩම 01)<br><br>ප්‍රශ්නාර්ථ ලකුණ යෙදුණු වාක්‍ය උපුටා ලිවීම හා කියවීම. (පාඩම 09) | | පැය<br>04 |

දෙවන ශ්‍රේණිය - මව්බස (සිංහල)

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| | | | | කොමාව යෙදුණු වාක්‍ය උපුටා ලිවීම හා කියවීම. (පාඩම 05)<br><br>සිංහල කියවීම් පොතේ පාඩම 04 කියවා සිංහල වැඩ පොතේ 10 පිටුවේ අභ්‍යාස කිරීම.<br><br>සිංහල කියවීම් පොතේ පාඩම 13 කියවා සිංහල වැඩ පොතේ 50 පිටුවේ අභ්‍යාස කිරීම. | | |
| | | | | | මුළු කාලය | පැය 35 |

# ගණිතය
## දෙවන ශ්‍රේණිය (පළමුවන වාරය)

ගණිතය විෂයමාලාවේ දෙවන ශ්‍රේණියේ පළමු වාරයට අදාළ අත්‍යවශ්‍ය ම ඉගෙනුම් සංකල්ප සාධනය සඳහා අවශ්‍ය විෂය අන්තර්ගතය මෙහි ඇතුළත් කර ඇත. සිසුන් පීඩනයට පත් නොවන අයුරින් ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා මෙය උදවු කර ගත හැකි ය. මෙහි යෝජනා කර ඇති කාලය උචිත පරිදි ගළපා ගනිමින් ගුරු මාර්ගෝපදේශයේ දක්වා ඇති මගපෙන්වීම් ද ප්‍රයෝජනයට ගෙන ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න.

ඒ අනුව දෙවන ශ්‍රේණියේ පළමුවන වාරයට යෝජිත මෙහි සඳහන් විෂය අන්තර්ගතවලට අදාළ ක්‍රියාකාරකම් කිරීමට පෙර පළමුවන ශ්‍රේණියේ දී ගණිතය විෂය සඳහා අත්පත් කරගත යුතු අත්‍යවශ්‍ය විෂය කොටස් සිසුන් තුළ සාධනය වී ඇද්දැයි පරීක්ෂා කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා පැය කිහිපයක් වෙන් කර සිසුන්ගේ හැකියාව මැන බැලීමට සහ සිසුන්ගේ පෙර මතකය ආවර්ජනය කිරීමට ඔබ විසින් සකස් කරන ලද ක්‍රියාකාරකම් සිසුන්ට ලබා දිය යුතු ය. ඒ අනුව එක් එක් සිසුන්ගේ සාධන මට්ටම පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඔබ විසින් ලබා ගත යුතු ය. ඉන් පසු ව දෙවන ශ්‍රේණිය සඳහා අප විසින් යෝජනා කරනු ලබන විෂය අන්තර්ගත සඳහා යොමු විය හැකි ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර සිසුන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා අත්කරගෙන ඇති ද යන්න තහවුරු කරගන්න. ක්‍රියාකාරකම්වලට උචිත අයුරින් ගණිතය වැඩ පොත සඳහා ද සිසුන් යොමු කරන්න. සමහර නිපුණතාවලට අදාළ ක්‍රියාකාරකම් පන්ති කාමරය තුළ සිදු කිරීමෙන් පසු ව එම සංකල්ප තව දුරටත් තහවුරු කිරීම සඳහා නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ අභ්‍යාස ලබා දිය හැකි ය.

## දෙවන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| | 1. සංඛ්‍යා හඳුනා ගෙන භාවිත කරයි. | 1.1. 1 සිට 9 තෙක් සංඛ්‍යාවක සංඛ්‍යාංකය හා සංඛ්‍යා නාමය කියවයි; නිවැරදි ව ලියයි. | ▪ 1 සිට 9 තෙක් සංඛ්‍යාවල සංඛ්‍යාංක හා සංඛ්‍යා නාම | පාඩම 04<br>ක්‍රියාකාරකම 1 සිට 3 | 12 සිට 14 | පැය 2 |
| | 2. රූප/සංඛ්‍යා රටා ගොඩනගයි. | 2.1. රූප රටාවක ඊළගට ආයුතු රූප හඳුනා ගෙන රටාව ඉදිරියට ගොඩනගයි.<br>2.2. රූප ඇසුරෙන් රටාව සංඛ්‍යා රටා ගොඩනගයි. | ▪ රූප සහ සංඛ්‍යා රටා | පාඩම 05<br>ක්‍රියාකාරකම 1 සිට 5 | 15 සිට 17 | පැය 3 මි.30 |
| | 3. එකතුව 9 තෙක් වන සංඛ්‍යා එකතු කරයි. | 3.1. එකතුව 9ට නොවැඩි වන සේ සංඛ්‍යා දෙකක එකතුව සොයයි.<br>3.2. එකතුව 9ට නොවැඩි වන සේ සංඛ්‍යා දෙකක එකතුව ඇතුළත් සරල ගැටලු විසඳයි. | ▪ එකතුව 9 තෙක් වන ගැටලු විසඳීම. | පාඩම 06<br>සියලු ම ක්‍රියාකාරකම් | 18 සිට 20 | පැය 3 මි.30 |

දෙවන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| | 4. 9 ට නොවැඩි සංඛ්‍යාවකින් එයට අඩු සංඛ්‍යාවක් අඩු කරයි. | 4.1 ද්‍රව්‍ය 9 ට අඩු සංඛ්‍යාවකින් ද්‍රව්‍ය කිහිපයක් ඉවතට ගත් විට ඉතුරු ද්‍රව්‍ය ගණන ප්‍රකාශ කරයි.<br><br>4.2. 9 ට නොවැඩි සංඛ්‍යාවකින් එයට අඩු සංඛ්‍යාවක් අඩු කරයි. | ■ 9 ට නොවැඩි සංඛ්‍යා ඇසුරෙන් අඩු කිරීම. | පාඩම 07<br>ක්‍රියාකාරකම 1 සිට 4 | 21 සිට 23 | පැය 3 මි.30 |
| ■ ජ්‍යාමිතික හැඩ හඳුනා ගෙන නම් කරයි. | 5. ජ්‍යාමිතික හැඩ නම් කරයි. | 5.1 අවට පරිසරයේ ඇති එක් එක් ජ්‍යාමිතික හැඩයට ගැළපෙන වස්තු සොයා ප්‍රකාශ කරයි.<br><br>5.2 ජ්‍යාමිතික ඝනවස්තුවල ඇති ද්විමාන හැඩ හඳුනා ගෙන නම් කරයි. | ■ වෘත්තය, ත්‍රිකෝණය, ඍජුකෝණාස්‍රය සහ සමචතුරස්‍රය<br><br>■ ඝනවස්තු ඇසුරෙන් හැඩ හඳුනා ගැනීම. | පාඩම 08<br>ක්‍රියාකාරකම 1 සිට 3 | 24 සිට 26 | පැය 3 මි.30 |

දෙවන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| | 6. ශූන්‍යය '0' හඳුනා ගෙන භාවිත කරයි. | 6.1 එකක්වත් නැත (ශූන්‍යය) යන්න නිරූපණ සඳහා '0' භාවිත කරයි. | ■ ශූන්‍යය හඳුනා ගැනීම. | පාඩම 09 ක්‍රියාකාරකම 1 සිට 2 | 27 සිට 29 | පැය 1 මි.30 |
| | 7. සංඛ්‍යා හඳුනා ගෙන භාවිත කරයි. | 7.1. 10 සිට 20 තෙක් සංඛ්‍යාංක සහ සංඛ්‍යා නාම ලියයි.<br><br>7.2. 10 සිට 20 තෙක් සංඛ්‍යාවක් ද්‍රව්‍ය /රූප මගින් නිරූපණය කරයි. | ■ 10 සිට 20 තෙක් සංඛ්‍යාවල සංඛ්‍යාංක හා සංඛ්‍යා නාම | පාඩම 10 ක්‍රියාකාරකම 1 සිට 3 | 30 සහ 31 | පැය 3 මි.30 |
| ■ දෙන ලද දිගක් අභිමත ඒකකයකින් නිවැරදි ව මැන ආසන්න අගය ප්‍රකාශ කරයි. | 8. අභිමත ඒකක භාවිතයෙන් දිග/උස මනියි. | 8.1 සුදුසු අභිමත ඒකකයක් හඳුනා ගෙන දිග/උස මනියි.<br><br>8.2 සුදුසු අභිමත ඒකකය හඳුනා ගෙන යම් දිගක් මනියි.<br><br>8.3 සරල රේඛාවක් දිගේ දිග මනියි. | ■ අභිමත ඒකකවලින් දිග මැනීම. | පාඩම 11 ක්‍රියාකාරකම 1 සිට 5 | 32 සිට 34 | පැය 3 මි.30 |
| | | | | | මුළු කාලය | පැය 24 මි.30 |

## පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්
## දෙවන ශ්‍රේණිය (පළමුවන වාරය)

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ පළමුවන ශ්‍රේණියට අදාළ අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගතය මෙහි දක්වා ඇත. ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී පරිසර ගවේෂණය, විද්‍යාත්මක සංකල්ප භාවිතය සිසුන් සමග සිදු කළ යුතු අතර මෙහි සඳහන් අනෙකුත් ඉගෙනුම් පලවලට අදාළ ක්‍රියාකාරකම් විශේෂයෙන් සෞන්දර්ය, ක්‍රීඩා හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් නිවෙස පාදක ව සිදු කිරීමට ද සිසුන් යොමු කළ යුතු ය. සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වලට අදාළ කවි, ගීත ආදියෙහි අර්ථය ගායනයට පෙර සිසුන්ට පැහැදිලි කරමින් ඊට අදාළ ප්‍රකාශනාත්මක චලන ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

චිත්‍ර ඇඳීමේ දී, ඇඹීමේ දී, ආකෘති ගොඩනැගීමේ දී සිසුන්ගේ ඇති දක්ෂතාවලින් ම සිය නිර්මාණ එළිදැක්වීමටත් ඒවා අගය කරමින් ඔවුන්ගේ නිර්මාණාත්මක කුසලතා සංවර්ධනය කිරීමටත් උත්සුක විය යුතු ය. නිවෙස් පාදක ව ක්‍රියාකාරකම් සිදු කරන සෑම අවස්ථාවක දී ම සිසුන්ගේ හැකියා වර්ධනය වන පරිදි ඊට අදාළ ක්‍රියාකාරකම් ඔවුන් විසින් ම කිරීම සඳහා යොමු කළ යුතු ය. සිසු නිර්මාණ පාසලට පැමිණෙන දිනයන්හි රැගෙන ඒමට හා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා ගන්න. කණ්ඩායම් ලෙස හෝ තනි තනි ව ප්‍රදර්ශනය කිරීමටත් ඒවා අගය කිරීමටත් කටයුතු කරන්න.

සිසුන් තුළ යහපත් ආකල්ප ඉස්මතු වන ආකාරයට සෑම ක්‍රියාකාරකමක් ම ගොඩනගා ගන්න. **ආදරය, කරුණාව, දයාව වැනි සංවර්ධනාත්මක චිත්තවේග දියුණු කිරීමටත්** ක්ෂේන්තිය, හිංසාව, රිදවීම වැනි අහිතකර චිත්තවේග පාලනය කිරීමටත් සෑම ක්‍රියාකාරකමකින් ම සමාජ හිතවාදී චර්යා ඉස්මතු කිරීමටත් වග බලා ගන්න.

**අන්මත ඉවසීම, අන් අයට ගරු කිරීම, නායකත්වයට ගරු කිරීම, සාමූහික ව කටයුතු කිරීම** ආදී සමාජ කුසලතා වර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීමට කටයුතු කරන මෙන් තව දුරටත් ඉතා ආදරයෙන් ඉල්ලා සිටිමු.

ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි විෂයයට අදාළ ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී ගුරු මාර්ගෝපදේශයේ දෙන ලද උපදෙස් අනුව කටයුතු කරන්න. ගීතවලට සහ වචනවලට අදාළ ශ්‍රව්‍ය පට (Audio materials) www.nie.lk - Downloads - other materials - English - ABOE මගින් ලබා ගන්න.

දෙවන ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පල | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| ▪ පාසල් පරිසරය තුළ ආචාරශීලී ව කටයුතු කරයි.<br>▪ උපකරණ භාවිත කරමින් ඉන්ද්‍රිය සමායෝජනයෙන් යුතු ව සෙල්ලම්වල නිරත වෙයි.<br>▪ පරිසරය ගවේෂණය කර තොරතුරු අනාවරණය කරගෙන ප්‍රකාශ කරයි. | 1 අපේ පාසල | ▪ පාසලේ කටයුතුවලට දායක වෙමින් පාසල් සංස්කෘතිය යහපත් ව පවත්වා ගෙන යාමට ක්‍රියා කරයි.<br><br>▪ පාසල තුළ තිබෙන සුවිශේෂ ස්ථාන හඳුනා ගෙන එම විවිධත්වය අනුව කටයුතු කරයි. | ▪ පාසල තුළ සුවිශේෂ ස්ථාන හඳුනා ගනියි.<br>▪ තමාගෙන් පන්ති කාමරයට හා පාසලට ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් ඉටු කරයි.<br>▪ පාසලේ පොදු දේපළ ආරක්ෂා කිරීමට තම දායකත්වය දක්වයි.<br>ABOE - Song This is the Way We Clean ..<br>ABOE - Words & Colour | 1 සිට 3<br><br><br><br><br><br><br><br><br>Song Book Gr 2<br><br>Activity Book Gr 2 | 106 සිට 108<br><br><br><br><br><br><br><br><br>03 - 04<br>02<br>03 | පැය 06 |
| | 2 අපේ ගෙදර | ▪ නිවස හා නිවසට සම්බන්ධ පුද්ගලයන් කෙරෙහි යහපත් ආකල්පයකින් කටයුතු කරයි. | ▪ පවුලේ සමීපතම ඥාතීන්ට ඥාතීත්වයෙන් අමතයි.<br>▪ දෙමව්පියන් හා නිවසේ අනෙකුත් සාමාජිකයින් තම යුතුකම් වගකීම් ඉටු කිරීම සඳහා සිදු කරන කටයුතු විස්තර කරයි.<br>ABOE - Song Kitchen...<br>ABOE - Words & Colour | 1 සිට 3<br><br><br><br><br><br><br><br>Song Book Gr 2<br>Activity Book Gr 2 | 111 සිට 113<br><br><br><br><br><br><br><br>07<br>04<br>05 | පැය 08 |

දෙවන ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පල | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| ■ පරිසරය ගවේෂණය කර තොරතුරු අනාවරණය කරගෙන ප්‍රකාශ කරයි.<br><br>■ තමාගේ මෙන් ම අන් අයගේ ද ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් ව කටයුතු කරයි. | 3 වත්තට එන සත්තු | ■ අවට පරිසරයේ වෙසෙන සතුන් අතර පවත්නා විවිධත්වය අධ්‍යයනය කර වාර්තා කරයි.<br><br>■ සතුන් ද පරිසරයේ ම කොටසක් සේ සලකා සතුන් පිළිබඳ සංවේදී ව කටයුතු කරයි.<br><br>■ අප අවට ඇති සතුන්ගේ චර්යා පිළිබඳ අවධානයෙන් යුතු ව චාලක ක්‍රියාකාරකම්වල නියැළෙයි. | ■ අවට පරිසරයේ දකින සතුන් බාහිර ස්වරූපය අනුව සරල ව වෙන් කර දක්වයි.<br><br>■ සතුන් ද පරිසරයේ කොටසක් ලෙස සලකමින් සතුන්ගේ පැවත්ම උදෙසා දායක වෙයි.<br><br>■ සත්ත්ව චර්යා පාදක කරගත් නිර්මාණාත්මක ක්‍රීඩාවල යෙදෙයි.<br><br>ABOE - Song I see...<br>ABOE - Words & Colour | 1 සිට 3<br><br>5 සහ 6<br><br>Song Book Gr 2<br>Activity Book Gr 2 | 116 සහ 117<br><br>119<br><br>08<br><br>06<br>07<br>08<br>09 | පැය 08 |

## දෙවන ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පල | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| ■ කාර්යයක් ආරම්භ කර අවසානය දක්වා පවත්වා ගෙන යයි. | 4 ජලය සමඟ සෙල්ලම් | ■ ජලය වටිනා සම්පතක් ලෙස සලකා ඵලදායී ලෙස භාවිත කරයි. | ■ ජලය වටිනා සම්පතක් ලෙස සලකා ඵලදායී ව භාවිත කිරීමට කටයුතු කරයි. | 01/02 | 121 - 122 | පැය 08 |
| | | ■ ජලයේ ස්වභාවය හා ද්‍රව්‍ය ජලය සමඟ හැසිරෙන ආකාරය පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි. | ■ ජලය තැනකින් තැනකට ගෙන යා හැකි ක්‍රම අත්හදා බලයි. | 03 | 122 | |
| | | | ■ විවිධ ද්‍රව්‍ය ජලය සමඟ ක්‍රියා කරන අයුරු පරීක්ෂා කර බලයි. | 06 / 07<br>10 | 123 - 124<br>125 | |
| | | ■ නීරෝගී දිවි පැවැත්ම සඳහා ජලයේ වැදගත්කම අගයමින් නිසි පරිදි භාවිත කරයි. | ■ නීරෝගී දිවි පැවැත්මක් සඳහා පිරිසිදු ජලය දිනකට ප්‍රමාණවත් පරිදි පානය කරයි. | 11 | 126 | |
| | | | ■ විවිධ නාද නිපදවීම සඳහා ජලය යොදා ගත හැකි ආකාර අත්හදා බලා අද්දැකීම් ප්‍රකාශ කරයි. | 08 | 124 | |
| | | | ■ ජලයේ පා කර හැරිය හැකි දෑ නිර්මාණය කරයි. | 10 | 125 | |
| | | | ABOE - Song Sink and Float...<br>ABOE - Words & Colour | Song Book Gr 2<br>Activity Book Gr 2 | | |

දෙවන ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාව | ඉගෙනුම් පල | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| | 5 අවුරුදු කාලය | ▪ අවුරුදු කාලයේ දී සිදු කරන කටයුතුවලින් සිදු විය හැකි අනතුරු පිළිබඳ ව විමසිලිමත් වෙමින් ඒවායෙන් ආරක්ෂා වීමට කටයුතු කරයි.<br><br>▪ විවිධ ජන කොටස්වල අවුරුදු චාරිත්‍ර වාරිත්‍රවලට ගරු කරයි. | ▪ අවුරුදු කාලයේ දී සිදු වන අනතුරුවලින් ආරක්ෂා වීමට කටයුතු කරයි.<br><br>▪ විවිධ ජන කොටස්වලට සුවිශේෂ වූ අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර සිදු කරන අයුරු ප්‍රකාශ කරයි.<br><br>ABOE - Song This is the Way We Clean the House ....<br>Oil Lamp<br>Let's Like Crakers | 03<br><br>04<br><br>05<br><br>Song Book Gr 1<br>Activity Book Gr 1 | 128<br><br>129<br><br>10<br>11<br>10<br>11<br>12<br>13 | පැය 05 |
| මුළු කාලය | | | | | | පැය 35 |

## දෙවන ශ්‍රේණිය - දෙවන ජාතික භාෂාව

| නිපුණතාව | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගු.මා.දේ පිටු අංකය | කාලය |
|---|---|---|---|---|
| ■ උපන්දින සඳහා සුබ පතයි. | **இனிய பிறந்தநாள் வாழ்த்துக்கள்** ඉනිය පිරන්දනාළ් වාල්ත්තුක්කළ් (සුබ උපන් දිනයක් වේවා)<br>**நன்றி** නන්රි (ස්තුතියි) | 1, 2, 5 | 206 සහ 208 | පැය 01 |
| ■ ආචාරශීලී ව හා සුහද ව ඉල්ලීම් කරයි. | **புத்தகம் எடுங்கள்** පුත්තහම් එඩුංගළ් (පොත ගන්න.)<br>**பென்சில் தாருங்கள்** පෙන්සිල් තාරුංගළ් (පැන්සල දෙන්න.)<br>**இங்கே வாருங்கள்** ඉංගේ වාරුංගළ් (මෙහෙ එන්න)<br>**அங்கே போங்கள்/செல்லுங்கள்** අංගේ පෝංගළ්/සෙල්ලුංගළ් (එහෙ යන්න.)<br>**இங்கே பாருங்கள்** ඉංගේ පාරුංගළ් (මෙහෙ බලන්න)<br>**அங்கே இருங்கள்** අංගේ ඉරුංගළ් (අතනින් ඉඳගන්න)<br>**அங்கே ஓடுங்கள்** අංගේ ඕඩුංගළ් (අතනට දුවන්න)<br>**இங்கே நில்லுங்கள்** ඉංගේ නිල්ලුංගළ් (මෙහෙ නවතින්න) | 1, 2 | 209 | පැය 01 මි.30 |
| ■ පවුලේ සාමාජිකයින්ගේ ඥාතීත්වය හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | **அம்மா** අම්මා (අම්මා)<br>**அப்பா** අප්පා (තාත්තා)<br>**அக்கா** අක්කා (අක්කා)<br>**அண்ணா** අණ්ණා (අයියා)<br>**தங்கை** තංගෛ (නංගී)<br>**தம்பி** තම්බි (මල්ලී) | 1, 3, 4 | 210 - 211 | පැය 01 |
| | | | මුළු කාලය | පැය 03 මි.30 |

## දෙවන ශ්‍රේණිය - බුද්ධ ධර්මය

| තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගු. මා. දේ.පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| 1 | ■ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය හැඳින ගෙන චරිතායනය කරයි. | ■ මහාමායා දේවිය දුටු සිහිනය විස්තර කරයි.<br>■ බෝසත් උපතේ අසිරිමත් සිදුවීම් පෙළ ගස්වයි.<br>■ බෝසත් කුමරුන්හට නම් තැබීමේ උලෙළේ විශේෂ සිදුවීම් ප්‍රකාශ කරයි.<br>■ බුදු සිරිත හා බැඳි කතා ඇසුරින් මහා කරුණා ගුණය ප්‍රදර්ශනය වන අවස්ථා සුදුසුඅයුරින් ඉදිරිපත් කරයි.<br>■ අන් අය කෙරෙහි කාරුණික ව හැසිරෙයි. | ■ මහාමායා දේවිය දුටු සිහිනය | පියවර 1<br>අසිරිමත් බෝසත් උපත<br>4 පාඩම<br>මහාමායා දේවිය දුටු සිහිනය | 1 | පැය 05 |
| | | | ■ මව් බිසව දෙව්දහ නුවරට යාම<br>■ මව් කුසින් බිහි වීම හා අභීත සිංහ නාදය | පියවර 2, 3<br><br>5 පාඩම<br>බෝසත් උපත | 1 | |
| | | | ■ පිය රජතුමාගේ පළමුවන වැඳුම<br>■ නම් තැබීම | නම් තැබීම<br>පියවර 1 පාඩම 6<br>පියරජුගේ පළමු වැඳුම<br>පාඩම 7<br>කුමරුට නම් තැබීම | 1 සහ 2 | |
| | | | ■ මට්ටකුණ්ඩලී කතාව | මහා කරුණා ගුණය<br>මට්ටකුණ්ඩලී කතාව පියවර 1, 2<br>මට්ටකුණ්ඩලී දෙව්පුත්<br>(පාඩම 8) | 2 | |
| | | | ■ ගැරඬියකු පෙළු ළමයින්ගේ කතාව | ගැරඬියකු පෙළු ළමයින්ගේ කතාව පියවර 1, 2<br>සතුන්ට කරුණාව දක්වමු<br>(පාඩම 9) | 3 | |

# දෙවන ශ්‍රේණිය - බුද්ධ ධර්මය

| තේමාව | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගු. මා. දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| 2 | ■ සුවිශේෂ බෞද්ධ චරිත හා ජාතක කතා හැඳින ආදර්ශයට ගෙන කටයුතු කරයි. | ■ අනේපිඬු සිටුතුමාගේ ජීවිතයෙන් ගත හැකි ආදර්ශ පැහැදිලි කරයි.<br>■ ලක්දිව බුදුසසුන බැබළ වූ මිහිඳු මහ රහතන් වහන්සේ පිළිබඳ ව අගය කරමින් කතා කරයි.<br>■ සාලිකේදාර ජාතකයේ සුවිශේෂ අවස්ථා මතකයෙන් කියයි.<br>■ දෙමව්පිය පෝෂණය හා සම්බන්ධ අවස්ථාවක් සාලිකේදාර ජාතකය ඇසුරින් භූමිකා රංගනයෙන් ඉදිරිපත් කරයි.<br>■ සතුන් පවා දෙමව්පියන් පෝෂණය කිරීමට කැප වී කටයුතු කළ ආකාරය පිළිබඳ ව අගය කරමින් කතා කරයි. | ■ අනේපිඬු සිටුතුමා | අනේපිඬු සිටුතුමා පියවර 1, 2<br><br>අනාථපිණ්ඩික සිටුතුමා (පාඩම 14) | 4 | පැය 3 මි.45 |
| | | | ■ මිහිඳු මහරහතන් වහන්සේ | මිහිඳු මහ රහතන් වහන්සේ | 21<br><br>55, 56 | |
| | | | ■ ජාතක කතා<br>■ සාලිකේදාර ජාතකය | ජාතක කතා<br><br>සාලිකේදාර ජාතකය 1, 2, 3, 4<br><br>සාලිකේදාර ජාතකය (පාඩම 16) | 5 | |
| | | | | | මුළු කාලය | පැය 8 මි.45 |

## දෙවන ශ්‍රේණිය - කතෝලික ධර්මය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | ■ මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ආදරය මැවිල්ල ඇසුරෙන් අද්දකියි. තුති පුදයි. ප්‍රතිප්‍රේමය දක්වයි. | ■ මහෝත්තම දෙවි පියාණන් අපට ලබා දී ඇති නව වසර සඳහා සතුට දනවන ගීතයක් ගායනා කරයි.<br>■ නව වසරේ මහෝත්තම දෙවි පියාණන් අපට පබා දී ඇති අලුත් දේ නම් කරයි.<br>■ මහෝත්තම දෙවි පියාණන්ගේ ආදරය නිසා අපට ලැබුණු ගුරුවරුන්, යහළුවන්, අසල්වැසියන් වෙනුවෙන් ස්තුති කර යාච්ඤාවක් උච්චාරණය කරයි. | ■ නව වසරට තුති පිදීම.<br>■ තමාට ආදරය කරන ගුරුවරු, යහළුවෝ, අසල්වැසියෝ | **2 ශ්‍රේණිය ගු.මා.දේ** පියවර 1,2,3,4<br><br>පෙළ පොතේ 1 පාඩම 46 පිටුව ක්‍රියාකාරකම<br><br>පියවර 1,2,3,4 පෙළ පොතේ 3 පාඩම | **2 ශ්‍රේණිය ගු.මා.දේ** 1<br><br><br>3, 4 | පැය 01 |
| | | ■ මහෝත්තම දෙවි පියාණන් වහන්සේ අපට ලබා දුන් සොබා දහම් සම්පත් ආරක්ෂා කළ යුතු බව ප්‍රකාශ කරයි. | ■ දේව ආදරයේ සලකුණ වන සොබා දහමේ සම්පත්<br>■ පොළොව, අහස,<br>■ දිය දහර | පියවර 1, 3, 4, 5 පෙළ පොතේ 2 පාඩම 53 පිටුව ක්‍රියාකාරකම | 2 | පැය 01 |
| | | ■ තම සිරුර රැක ගැනීමට අවශ්‍ය දෛනික සෞඛ්‍ය පුරුදු නම් කරයි.<br>■ එම සෞඛ්‍ය පුරුදු අනුගමනය කරයි. | ■ පෞද්ගලික පිරිසිදුතාවය මඟින් මහෝත්තම දෙවිඳුන් දුන් සිරුරට ගරු කිරීම.<br>■ දෛනික සෞඛ්‍ය පුරුදු | පියවර 1,2,3 පෙළ පොතේ 4 පාඩම 8 පිටුව ක්‍රියාකාරකම | 3 | පැය 01 |

## දෙවන ශ්‍රේණිය - කතෝලික ධර්මය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | ■ උත්තරීතර ජේසුස් වහන්සේගේ සුවිශේෂ ගුණාංග නම් කරයි. | ■ මහෝත්තම ජේසුස් වහන්සේගේ දුක් විඳීම, මරණය සහ උත්ථානය මඟින් අපට ආදරය දැක්වූ බව සංවේදී ව ප්‍රකාශ කරමින් චතාරික ගීතිකා ගායනාවේ නිරත වෙයි.<br>■ පාද නමස්කාරයට සහභාගි වෙයි. | ■ අවනත භාවය<br>■ මහෝත්තම දෙවි පියාණන් වහන්සේට අවනත වීම (පාස්කු සිද්ධිය) | පියවර 1,2.3,4<br>පෙළ පොතේ<br>5 පාඩම<br>47 පිටුව<br>ක්‍රියාකාරකම | 22<br>23 | පැය 01 |
| | | ■ ජේසු සමිඳුන්ගේ කුඩා කළ සිදුවීම් ප්‍රකාශ කරයි.<br>■ නිවසේ දී දෙමව්පියන්ට කීකරු වූ අවස්ථාවක් චිත්‍රයට නඟයි. | ■ දෙමව්පියන්ගේ සහ ගුරු මව්පියන්ගේ යහපත් ඔවදන්වලට කීකරු වීම | පියවර 1,2,3,4<br>පෙළ පොතේ<br>6 පාඩම | 6<br>7 | පැය 01 |
| | | ■ අපේ උදවු අවශ්‍ය අයට පිහිට වීමෙන් මහෝත්තම දෙවි පියාණන් වහන්සේට ආදරය කළ හැකි බව ප්‍රකාශ කරයි.<br>■ විශේෂ අවශ්‍යතා ඇති අය සහ රෝගීන් වෙනුවෙන් යාච්ඤා කරයි. | ■ අපේ උදවු අවශ්‍ය අයට පිහිට වීම. | පියවර 1, 3, 4<br>පෙළ පොතේ<br>7 පාඩම | 8<br>9 | පැය 01 |
| | | ■ ආදර්ශවත් කිතුනු දරුවකු ලෙස 'හොඳ ළමයා' දිනය ගත කරන ආකාරය විස්තර කරයි.<br>■ යහපත් කිතුනු ගුණාංග ඇති කර ගනිමින් ආදර්ශවත් කිතුනු දරුවකු ලෙස කටයුතු කරන ආකාරය චිත්‍රයට නඟයි. | ■ යහපත් කිතුණු දරුවකු වීම | පියවර 1,2,4<br>පෙළ පොතේ<br>8 පාඩම | 10<br>11 | පැය 01 |

දෙවන ශ්‍රේණිය - කතෝලික ධර්මය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | ▪ මහෝත්තම දෙවි පියාණන් වහන්සේ සමඟ කතා කරයි. | ▪ මහෝත්තම දෙවි පියාණන් වහන්සේට වන්දනා නමස්කාර කිරීමේ දී පිළිපැදිය යුතු ඉරියව් පෙන්නුම් කරයි.<br>▪ දේවස්ථානයට ගොස් නිවැරදි ඉරියව් යොදා ගනිමින් යාච්ඤා උච්චාරණය කරයි. | ▪ නැමදීමේ ඉරියව්<br>▪ දෑත් එක්කර වැඳීම<br>▪ දොහොත් මුදුන් දී වැඳීම<br>▪ දණ නමස්කාර කර වැඳීම | පියවර 1, 2 (පාසල අසල ම දේවස්ථානයක් ඇත්නම් පමණක් පියවර 3, 4 යොදා ගන්න.) පෙළ පොතේ 9 පාඩම | 12<br>13 | පැය 01 මි.45 |
| | | | | | මුළු කාලය | පැය 08 මි.45 |

දෙවන ශ්‍රේණිය - ක්‍රිස්තියානි ධර්මය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | ■ දේව ප්‍රේමයට ප්‍රතිචාර දක්වමින් යහපත් කිතුනු ගුණාංග වඩවා ගනියි. | ■ ආදර්ශවත් කිතුනු දරුවකු ලෙස නිරත විය හැකි යහපත් කටයුතු වර්ධනය කරගත යුතු යහපත් කිතුනු ගුණාංග පිළිබඳ සාකච්ඡා කරයි. | 1) යහපත් කිතුනු ගුණාංග හා වටිනාකම් රෝම 12: 10 - 13 | පියවර 1,2,3,<br><br>පෙළ පොතේ 6 වන පාඩම | 10,11<br><br>9 ,11 | පැය 01 මි.15 |
| | ■ ජේසුස් වහන්සේ හඳුනා ගනියි. අනුගමනය කරයි. | ■ ජේසුස් වහන්සේ ජෙරුසලමේ දේවමාළිගාවේ දී පඬිවරුන්ට සවන් දෙමින් හා ප්‍රශ්න විචාරමින් සිටි සිදුවීම ඇසුරින් කෙටි ප්‍රශ්න කිහිපයකට වාචික පිළිතුරු සපයයි. | 2) දේවමාළිගාවේ දී පඬිවරුන්ට සවන් දෙමින් හා ප්‍රශ්න විචාරය ශු.ලූක් 2 : 46 - 47 | පියවර 1,2,3,4<br><br>පෙළ පොතේ 7 වන පාඩම | 12<br><br>12 ,13 | පැය 01 මි.15 |
| | | ■ ජේසුස් වහන්සේගේ බෞතීස්මය පිළිබඳ කරුණු පන්තියට ඉදිරිපත් කරයි. | 3) ජේසුස් වහන්සේගේ බෞතීස්මය ශු.මාක් 1 : 9 - 11 | පියවර 1,2,3,4<br><br>පෙළ පොතේ 8 වන පාඩම | 13<br><br>14 ,15 | පැය 01 මි.15 |
| | | ■ ජේසුස් වහන්සේ මවට සවන් දෙමින් යහපත් ප්‍රතිචාර දැක්වූ ආකාරය ආදර්ශයට ගෙන දෙමව්පියන්ට කීකරු වන අවස්ථා නම් කරයි. | 4) මවට සවන් දීම හා යහපත් ප්‍රතිචාර දැක්වීම. ශු.ජොහාන් 2 : 1 - 12 | පියවර 1,2,3,4<br><br>පෙළ පොතේ 9 වන පාඩම | 14<br><br>16 ,17 | පැය 01 මි.15 |

දෙවන ශ්‍රේණිය - ක්‍රිස්තියානි ධර්මය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| | ■ ජේසුස් වහන්සේගේ ජීවිතයේ සුවිශේෂ වටිනාකම් හඳුනා ගනියි. | ■ දේව මැවිල්ල පෝෂණ කරන දෙවි පියාණන් වහන්සේ අපට සියල්ල සපයන බව විශ්වාසයෙන් අදහමින් මානෙල් මල් පුවරුවක හා කුරුලු කැදැල්ලක ආකෘතියක් නිර්මාණය කරයි. | 5) දෙවිපියාණන් වහන්සේ සියල්ල සපයන බව ශු. මතෙව් 6 : 25 - 28 | පියවර 1,2<br>පෙළ පොතේ 10 වන පාඩම | 15<br>18,19 | පැය 01 මි.15 |
| | | ■ දෙවිඳුන් මැවූ සැම කෙනෙකු තුළ ම වටිනාකමක් ඇති බව පිළිගනිමින් ගේ කුරුල්ලන් ගැන ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් ගැන අදහස් දක්වයි. | 6) සැම කෙනෙකු තුළ ම වටිනාකමක් ඇති බව ගේ කුරුල්ලන් ශු. මතෙව් 10 : 29 - 31 | පියවර 1,2,3,4<br>පෙළ පොතේ 11 වන පාඩම | 16<br>20,21 | පැය 01 මි.15 |
| | | ■ ජේසුස් වහන්සේ ඉගැන්වූ යාච්ඤාව ඇසුරෙන් දෙවි පියාණන් වහන්සේව හඳුනා ගනිමින් එම යාච්ඤාව තනි ව ප්‍රකාශ කරයි. | 7) ජේසුස් වහන්සේ ඉගැන්වූ යාච්ඤාව ශු. මතෙව් 6 : 9 - 13 | පියවර 1,2,3,4<br>පෙළ පොතේ 12 වන පාඩම | 17<br>22,23 | පැය 01 මි.15 |
| | | | | | මුළු කාලය | පැය 08 මි.45 |